සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved/

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

14 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | | |
|---|---|---|
| කතෝලික ධර්මය | I, II | පැය තුනයි |
| கத்தோலிக்கத் திருமறை | I, II | மூன்று மணித்தியாலம் |
| Catholicism | I, II | Three hours |

## කතෝලික ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍රය කුමක් ද?
   (1) ශුද්ධ බයිබලය (2) පංච පුස්තකය (3) නව ගිවිසුම (4) පැරණි ගිවිසුම

2. පැරණි ගිවිසුම තුළ අඩංගු වන්නේ,
   (1) සභා සම්ප්‍රදාය ය. (2) නීති පද්ධතිය ය.
   (3) ගැලවීමේ ඉතිහාසය ය. (4) දිවැසිවරුන්ගේ කැඳවීම ය.

3. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචනා කළේ කුමන ස්ථානයක ද?
   (1) රෝමයේ වතිකානුව (2) ග්‍රීසියේ අක්කාය
   (3) ජෙරුසලම (4) බෙත්ලෙහෙම

4. එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ
   (1) දෙකකි. (2) තුනකි. (3) හතරකි. (4) පහකි.

5. ජුදයින් අතට පාවා දීමෙන් අනතුරුව ජේසුස් වහන්සේව රැගෙන ගියේ,
   (1) උත්තම පූජකයාගේ මැඳුර වෙත ය. (2) කපාල කන්දට ය.
   (3) ගෙත්සෙමනී උයනට ය. (4) සැන්හෙඩ්‍රින් සභාවට ය.

6. ජේසුස් වහන්සේගේ උත්ථානයේ ප්‍රථම සාක්ෂිකාරිය වූයේ කවුරුන් ද?
   (1) මග්දලාවේ මරියා (2) මරිය තුමිය (3) මරියා (4) එලිසබෙත් තුමිය

7. "ඔබ ක්‍රිස්තුවරයාණෝ ය. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ" යැයි පැවසුයේ,
   (1) ශුද්ධ වූ පාවුලු තුමා ය. (2) ශුද්ධ වූ පේදුරු තුමා ය.
   (3) ශුද්ධ වූ ජොහන් තුමා ය. (4) ශුද්ධ වූ තෝමස් තුමා ය.

8. "දේව ප්‍රසාද නිධානයන්ගේත් දේව ප්‍රසාද නිධානය" නමින් හඳුන්වනු ලබන්නේ,
   (1) දිව්‍ය සත්ප්‍රසාදයයි. (2) ප්‍රසාද ස්නාපනයයි.
   (3) පූජාත්වරයයි. (4) ආශිර්වාදකාර බන්ධනයයි.

9. "බලාපොරොත්තුවේ එළිපත්ත" නැමති පොත රචනා කරන ලද්දේ,
   (1) ශුද්ධ වූ තෙරේසා මව්තුමිය ය. (2) ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ය.
   (3) ගරු මයිකල් රොඩ්‍රිගු (නි.ම.නි.) පියතුමා ය. (4) ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා ය.

10. "යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවකුට නැත" යන්න තම ආදර්ශ පාඨය කර ගත්තේ,
   (1) ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ය. (2) 16 වන බෙනදික් ශුද්ධෝත්තම පියතුමා ය.
   (3) ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා ය. (4) ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා ය.

11. පළමු පනත කුමක් මත පදනම් වන්නේ ද?
   (1) විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය මත (2) දේව මහිමය සියල්ලට උරුම වීම මත
   (3) මිනිසා දෙවියන් වහන්සේට දක්වන ගෞරවය මත (4) දෙවියන් වහන්සේ අපට දක්වන ආදරය මත

/දෙවැනි පිටුව බලන්න

12. බලාපොරොත්තුවට විරුද්ධව ඇතිවන පාපය වන්නේ,
(1) ඉච්ඡාභංගත්වය සහ අනුමානයයි.
(2) ක්‍රිස්තුන් වහන්සේගෙන් ඈත්වීමයි.
(3) ස්වර්ග රාජ්‍ය අහිමි කර ගැනීමයි.
(4) ශුද්ධාත්ම දීමනා අහිමි කර ගැනීමයි.

13. "දරුවනි, සියලු කාරණාවල දී දෙමාපියන්ට කීකරුවන්න, මන්ද එසේ කිරීම සමිඳුන්ට ප්‍රීතියකි." ශුද්ධ වූ පාවුලු තුමා මෙසේ පවසන්නේ,
(1) පිලිප්පි සංඝයට ය.
(2) එපිස සංඝයට ය.
(3) රෝම සංඝයට ය.
(4) කොලොස්සි සංඝයට ය.

14. ශුද්ධ ලියවිල්ලේ ඉගැන්වීම් ප්‍රකාර දිවි ගෙවීම තුළින් ප්‍රේමය පවුල තුළ පමණක් නොව සමාජය තුළ ද අත්දැකිය හැකි බව අපට උගත් වන්නේ,
(1) පළමුවන පනත ය.
(2) දෙවන පනත ය.
(3) හතරවන පනත ය.
(4) හයවන පනත ය.

15. දෙවියන් වහන්සේ පොළවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ඔහුගේ නාස් පුඩු තුළට ජීවන හුස්ම හෙළූ බව සඳහන් වී ඇත්තේ,
(1) පළමු මැවීමේ කතාවේ ය.
(2) දෙවන මැවීමේ කතාවේ ය.
(3) ලෙවී ව්‍යවස්ථාවේ ය.
(4) නික්මයාම පොතේ ය.

16. "මරණයට පත් වුනත් මම මගේ දේව ජීවිතය නැති කර ගන්නේ නැහැ" කියා ජේසුට දුන් පොරොන්දුව ඉටු කළ බව මිය යන විට පැවසුවේ,
(1) ශුද්ධ වූ තෙරේසා මව්තුමිය ය.
(2) ශුද්ධ වූ ඇග්නස් තුමිය ය.
(3) ශුද්ධ වූ මරියා ගොරෙත්ති තුමිය ය.
(4) ශුද්ධ වූ ඉසබෙලා තුමිය ය.

17. "ඔබගේ ශරීරය ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ ඔබ තුළ වැඩවසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වන බව ඔබ නොදන්නාහුද"යි ශුද්ධ වූ පාවුලුතුමා කොරෙන්ති සංඝයට උගන්වන්නේ කුමන පනත් **දෙක** සම්බන්ධව ද?
(1) හත සහ දහය (2) තුන සහ හතර (3) පහ සහ අට (4) හය සහ නවය

18. "සොරකම් කළ අය තවත් සොරකම් නොකරත්වා. ඒ වෙනුවට අවංක දුගීන්ට උපකාර කළ හැකි සේ වෙහෙස මහන්සි දරා වැඩක් කරත්වා"යි ශුද්ධ වූ පාවුලු තුමා කුමන සංඝයට උගන්වයි ද?
(1) එපීස (2) පිලිප්පි (3) තෙසලෝනික (4) කොරෙන්ති

19. බොරුකීම සුළු දෙයක් ලෙස පෙනුනත් එය මහා බරපතල වරදක් බව ප්‍රකාශ වන්නේ,
(1) වංචාකාර ගබඩාකරුගේ උපමාව මඟිනි.
(2) පරිසිවරයා සහ අයකැමියා පිළිබඳ උපමාව මඟිනි.
(3) අනනියස් සහ සපිරාගේ මරණය තුළිනි.
(4) අත්තික්කා ගස පිළිබඳ උපමාව මඟිනි.

20. ජනවන්දනා වසර ආරම්භ වන්නේ,
(1) ආගමන කාලයේ පළමු ඉරුදින දී ය.
(2) ශුද්ධාත්ම මංගල්‍ය දින දී ය.
(3) ජනවාරි මස පළමුවන දින දී ය.
(4) පාස්කු ඉරුදින දී ය.

21. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ සඳහන් පූජක සම්ප්‍රදායට අයත් සිද්ධියක් වන්නේ කුමක් ද?
(1) කායින් සහ ආබෙල් සිද්ධිය
(2) මැවීමේ දෙවන කථාව
(3) ආදම් සහ ඒව පාපයට වැටීමේ සිද්ධිය
(4) නෝවා සමඟ ගිවිසුම

22. පංච පුස්තකයේ ඇති වැදගත්කම වන්නේ,
(1) මැවුම්කරු සහ මිදුම්කරු වන දෙවියන් වහන්සේට පමණක් වන්දනා කිරීම පහදා දීමයි.
(2) දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව පහදා දීමයි.
(3) මිනිසා දේව නිර්මාණයක් බව පහදා දීමයි.
(4) දෙවියන් වහන්සේට සියල්ල කළ හැකි බව පහදා දීමයි.

23. පහත සඳහන් ග්‍රන්ථ අතුරෙන් පැරණි ගිවිසුමේ ඇති ද්විතීය ග්‍රන්ථය කුමක් ද?
(1) ඔබදියා (2) විලාප ගී (3) ජුදිත් (4) හිතෝපදේශය

24. පහත සඳහන් දිවැසිවරුන් අතුරෙන් දේශක දිවැසිවරයෙක් වන්නේ කවුරුන් ද?
(1) ඔබදියා (2) ආමෝස් (3) නාතාන් (4) හබකුක්

25. "මනුෂ්‍ය පුත්‍රය, මේ පොත අනුභව කර ගොස් ඉශ්‍රායෙල් වංශයට කතා කරන්නැ"යි වදාළේ කා හට ද?
(1) ජෙරමියා දිවැසිවරයාට
(2) ජොයෙල් දිවැසිවරයාට
(3) එසකියෙල් දිවැසිවරයාට
(4) ආමොස් දිවැසිවරයාට

26. ජේසුස් වහන්සේගේ වංශාවලියෙන් තම සුවිශේෂය ආරම්භ කරන්නේ,
(1) ශුද්ධ වූ මතෙව් තුමා ය.
(2) ශුද්ධ වූ මාක් තුමා ය.
(3) ශුද්ධ වූ ලූක් තුමා ය.
(4) ශුද්ධ වූ ජොහන් තුමා ය.

/තුන්වැනි පිටුව බලන්න

27. උත්පත්ති පොතේ 3 වන පරිච්ඡේදයේ දැක්වෙන සර්පයාගෙන් සංකේතවත් කරන්නේ,
(1) නපුර ය. (2) මිනිසා තුළ ඇති රුචිය ය.
(3) බාල් දේව වන්දනාව ය. (4) යක්ෂයාව ය.

28. නෝවාගේ ගිවිසුමේ බාහිර සලකුණ වන්නේ,
(1) දේදුන්නයි. (2) චර්මඡේදනයයි. (3) එතෙරවීමයි. (4) දස පනතයි.

29. ප්‍රාතිහාර්යයක් යනු ස්වභාව ධර්මය තුළ අප දන්නා සත්‍යතාවන්ට පටහැනිව සිදුවන ක්‍රියාවක් බව පවසන්නේ,
(1) ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමා ය. (2) ශුද්ධ වූ ඇක්වයිනස් තුමා ය.
(3) ශුද්ධ වූ අගුස්තීනු තුමා ය. (4) ශුද්ධ වූ ඉරනේරිස් තුමා ය.

30. ස්වර්ග රාජ්‍යයට ඇතුලුවීමට නම් අප ප්‍රසාද ස්නාපනය ලැබිය යුතු බව ජේසුස් වහන්සේ පැවසුයේ,
(1) ශුද්ධ වූ පේද්‍රු තුමාට ය. (2) නිකදේමුස්ට ය.
(3) ශුද්ධ වූ ජොහන් තුමාට ය. (4) පොහොසත් තරුණයාට ය.

31. පූජකවරයේ පූර්ණත්වය හිමිවන්නේ,
(1) තේවාචාරි ධූරයට ය. (2) පූජාප්‍රසාදි ධූරයට ය.
(3) රාජගුරු ප්‍රසාදි ධූරයට ය. (4) මධ්‍යාධිපති ධූරයට ය.

32. කතෝලික විවාහයේ බාහිර සලකුණ වනුයේ,
(1) මුදු හුවමාරු කිරීම ය. (2) දෙමාපියන් නැමදීම ය.
(3) සාක්ෂියට අත්සන් කිරීම ය. (4) විවාහ පොරොන්දුව ය.

33. පැවිදි වේදහාර **තුන** නම්,
(1) සාංඝික ජීවිතය, යාච්ඤාවේ ජීවිතය සහ සේවයේ ජීවිතයයි.
(2) ව්‍රතශුද්ධිය, කීකරුකම සහ දිළිඳුකමයි.
(3) ඒකත්වය, අඛණ්ඩත්වය සහ බඹසරයි.
(4) කීකරුකම, බඹසර සහ යාච්ඤාවේ ජීවිතයයි.

34. පැරණි ගිවිසුමේ 'සාමය' සඳහා භාවිත කරන හෙබ්‍රෙව් වචනය වනුයේ,
(1) ෂාලොම් ය. (2) එලොහිම් ය. (3) ප්‍රොෆෙටෙස් ය. (4) යාවේ ය.

35. ශාරීරික පුණ්‍ය ක්‍රියා කරනු ලබන්නේ කිසියම් පුද්ගලයකුගේ
(1) ආත්මික තෘප්තිය සඳහා ය. (2) මානසික යහපත සඳහා ය.
(3) ආත්මික යහපත සඳහා ය. (4) ශාරීරික යහපත සඳහා ය.

36. පහත සඳහන් ක්‍රියා අතුරෙන් ආත්මික පුණ්‍ය ක්‍රියාවක් වන්නේ කුමක් ද?
(1) සාගිනිවූවනට ආහාර දීම (2) වහලුන් නිදහස් කිරීම
(3) මළවුන් වැළලීම (4) ජීවතුන් හා මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම

37. නියම වූ දිනයන් හි ගොඩමස් වැළකීම සහ එක්වරු ශීලය රැකීම සඳහන් වනුයේ,
(1) සභා නීති සංග්‍රහයෙහි ය. (2) ලූක් සුවිශේෂයේ ය.
(3) දස පනතෙහි ය. (4) රෝම සංදේශයෙහි ය.

38. ප්‍රශංසාත්මක පැතුම් තුනක් හා ආධ්‍යාත්මික අවශ්‍යතා පදනම් කරගත් ඉල්ලීම් හතරක් අඩංගු යාච්ඤාව කුමක් ද?
(1) ස්වාමිවාක් ආරාධනාව (2) උත්තම පූජක යාච්ඤාව
(3) තුන්කාලේ ආරාධනාව (4) ස්තෝත්‍රික යැදුම

39. "හැම පරපුරක්ම මෙතැන් සිට භාග්‍යවන්තීය'යි මට කියනු ඇත"යි මරියතුමිය පැවසුයේ,
(1) බර්නදෙත් තුමියට ය. (2) එලිසබෙත් තුමියට ය.
(3) ගාබ්‍රියෙල් දේව දූතයාට ය. (4) ශුද්ධ වූ ජුසේ තුමාට ය.

40. ගීතාවලියේ තෙහෙලි ගී ඇසුරෙන් සංඝයම එක්රැස් වී සිදු කළ ප්‍රශංසාත්මක යැදුමක් වන්නේ,
(1) ස්තෝත්‍රික යාගික යැදුමයි. (2) යාම යැදුමයි.
(3) මරිය උදාන ගීයයි. (4) සකරියස්ගේ උදාන ගීයයි.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW — ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka — 14 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | |
|---|---|
| කතෝලික ධර්මය | I, II |
| கத்தோலிக்கத் திருமறை | I, II |
| Catholicism | I, II |

## කතෝලික ධර්මය II

- ※ **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ※ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) දේව වචනයේ (අනාවරණයේ) මූලාශ්‍ර **දෙක** මොනවා ද?
(ii) ශුද්ධ වූ පාවුලු තුමා ලිපි (හසුන්) ලිවීමේ පරමාර්ථ **දෙක** ලියන්න.
(iii) ඉශ්‍රායෙලයේ පූජා බෙදිය හැකි ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.
(iv) ආදි පිතෘ ජාකොබ්ගේ පුත් ජෝෂප් පොතිපර්ගේ බිරිඳට එකඟ වූයේ නම් කඩ වන පනත් **දෙක** මොනවා ද?
(v) දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් **දෙක** මොනවා ද?
(vi) ඉශ්‍රායෙල් දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් **දෙක** මොනවා ද?
(vii) දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කර ගත් ගිවිසුමේ අඩංගු ප්‍රධාන කරුණු **දෙක** මොනවා ද?
(viii) සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන **දෙක** මොනවා ද?
(ix) මැවීම පිළිබඳ දෙවන කථාවෙන් දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් **දෙක** මොනවා ද?
(x) දේව මාතාවන් දර්ශනය වූ ස්ථාන **දෙකක්** සඳහන් කරන්න.

**2.** (i) ගෞරවනීය ජාකෝම් ගොන්සාල්වේස් පියතුමා රචනා කළ පොත් **දෙකක්** නම් කරන්න.
(ii) ශුද්ධ වූ ජුසේ වාස් පියතුමා සිදු කළ ප්‍රාතිහාර්ය **තුනක්** ලියන්න.
(iii) ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ අවධියේ කතෝලිකයනට මුහුණ පෑමට සිදු වූ බාධක කරුණු **පහක්** ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න.

**3.** (i) ශුද්ධ වූ තෙරේසා මව්තුමිය ප්‍රථමයෙන් ඇතුළු වූ පැවිදි නිකාය සහ පසුව එතුමිය විසින් ආරම්භ කරන ලද පැවිදි නිකාය කුමක් ද?
(ii) ශුද්ධ වූ තෙරේසා මව්තුමියගේ බෞතිස්ම නාමය සහ එතුමියට ලැබුණු විරුදාවලි නම් **දෙකක්** සඳහන් කරන්න.
(iii) ශුද්ධ වූ තෙරේසා මව්තුමියගේ කැපවුණ සේවය අගය කරමින් එමඟින් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

**4.** (i) මැවීම පිළිබඳ පළමු සහ දෙවන කථාවල සම්ප්‍රදායන් **දෙක** මොනවා ද?
(ii) සියලු මැවිලිවලට වඩා මිනිසාගේ උතුම්කම විද්‍යාමාන වන කරුණු **තුන** මොනවා ද?
(iii) දේව අණට පිටු පෑම නිසා ආදි මව්පියන්ට සහ සර්පයාට දුන් දඬුවම් සඳහන් කර, ඔබ දේව අණට කීකරු වන අයුරු කෙටියෙන් විස්තර කරන්න.

**5.** (i) මිසර වැසියන් මුහුණ පෑ වසංගත **දෙකක්** ලියන්න.
(ii) ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට රජතුමා අනුගමනය කළ පියවර **තුන** මොනවා ද?
(iii) ඉශ්‍රායෙල් ජනතාව නික්මයාම ගමන තුළ දිව්‍ය සංරක්ෂණය අත් දුටු ආකාරය කරුණු **තුනකින්** පෙන්වා දී, ඔබගේ ජීවිතය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දකින අයුරු කරුණු **දෙකකින්** කෙටියෙන් පෙන්වා දෙන්න.

**6.** (i) කිතුනු විවාහයේ ලක්ෂණ **දෙක** මොනවා ද?
(ii) කතෝලික විවාහයට ඇති නීත්‍යානුකූල බාධා **තුනක්** සඳහන් කරන්න.
(iii) දෙමව්පියන් වෙනුවෙන් දරුවන් සතු යුතුකම් කරුණු **පහක්** ඇසුරින් පෙන්වා දෙන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
(i) පෙන්තකොස්ත සිද්ධිය
(ii) සත්‍යයට සාක්ෂි දැරීම
(iii) ශ්‍රී ලංකාවේ සාරධර්ම තුළ දේව රාජ්‍යයේ වටිනාකම්
(iv) ගිහි ධර්මදූත සේවය

※ ※ ※